සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

| 51 | S | II |
|---|---|---|

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

**Second Term Test - Grade 13 - 2019**

විභාග අංකය ..................................  චිත්‍ර II  කාලය පැය තුනයි

<u>අයදුම්කරුවන්ට උපදෙස්</u>

- ඔබේ නම/විභාග අංකය ඔබ චිත්‍රය අඳින කඩදාසියේ පසුපිටේ පැහැදිලිව ලියන්න.
- උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට එය වියළී තිබීම වැදගත්ය. තෙත් චිත්‍ර එකිනෙකට ඇලීමට ඉඩ ඇති බැවින්, එය ඔබට අවාසි විය හැකිය.

මාධ්‍යය :-

දියසායම්, පෝස්ටර් සායම්, කුඩු සායම්, පැස්ටල් හෝ මෙම මාධ්‍ය මිශ්‍රිතව හෝ භාවිත කිරීමට නිදහස ඇත.

## ස්වාභාවිකත්ව අධ්‍යයනය හා නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය.

- ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය සහිත පැලැටිය පහත සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින් ඇඳ වර්ණ කරන්න.
- කඩදාසි තලය, අර්ථවත්ව භාවිතා කරමින් චිත්‍රය සැලසුම් කිරීම.
- එකිනෙක ද්‍රව්‍යයන්ගේ ස්වභාවය හා පරිමාණය හොඳින් අවබෝධ කරගෙන දකින දේ ඇඳීම.
- ඇස් මට්ටම, පර්යාවලෝකය. සහ ත්‍රිමාණ ලක්ෂණ අවබෝධයෙන් යුතුව භාවිතා කිරීම.
- ගති ලක්ෂණ හා මතුපිට ස්වභාවය දැක්වෙන පරිදි වර්ණ මාධ්‍ය හැසිරවීමේ ශිල්ප ක්‍රමය අර්ථවත්ව භාවිතා කරමින් ද්‍රව්‍ය සමූහයට ගැළපෙන වර්ණවත් පසුබිමක් යෙදීම.
- සමස්ත චිත්‍රයේ නිමාව සහ ඉන් මතුවන චිත්‍රමය ලක්ෂණ පිළිබඳ සැලකිලිමත් වීම.
- ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ලේ පරිමාණය ඔබගේ චිත්‍රයට නොගැළපේ නම් ගැළපෙන පරිදි වෙනස් කර ඇඳීමට ඔබට ඉඩකඩ තිබේ.

**අභිමතාර්ථ :-**

1. ස්වභාවික හා නිර්මිත වස්තුන්ගේ ස්වභාවය හා හැඩය තේරුම් ගැනීමේ හැකියාව සිද්ධාන්ත භාවිතය පිළිබඳ කුසලතාවය හා ක්‍රම ශිල්ප භාවිතය මැන බැලීම.
2. රේඛා මාධ්‍ය භාවිතයෙන් වස්තුන්ගේ ගති ලක්ෂණ නිරූපණය වනසේ ප්‍රකාශ කිරීමේ හැකියාව හා සම්පිණ්ඩනය කිරීමේ හැකියාව මැන බැලීම.
3. වර්ණ භාවිතා කිරීමේ ක්‍රම ශිල්ප හා වස්තුන්ගේ ගති ලක්ෂණ මතුවන සේ වර්ණ භාවිතය පිළිබඳ හැකියාව මැන බැලීම.

**ලකුණු දීමේ නිර්ණායකඃ-**

01. ද්‍රව්‍ය සමූහය තලය මත අර්ථවත් ව සංරචනය කිරිමේ හැකියාව (ල. 20)
02. ද්‍රව්‍යයන්ගේ පරිමාණ හා ස්වභාවය ප්‍රකාශ කිරීමේ හැකියාව (ල. 20)
03. සිද්ධාන්ත භාවිතය පිළිබඳ අවබෝධය (පර්යාවලෝකය,ත්‍රිමාණ ලක්ෂණ, ඇස්මට්ටම, අවකාශ භාවිතය) (ල. 20)
04. වර්ණ භාවිතය හා ගති ලක්ෂණ දැක්වීම. (ල. 20)
05. චිත්‍රයේ පසුතලය ඇතුළු සමස්ත නිමාව (ල. 20)

II වන ප්‍රශ්න පත්‍රය සඳහා හිමිවන මුළු ලකුණු 100

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

**51 S I**

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

**Second Term Test - Grade 13 - 2019**

විභාග අංකය .................................. **චිත්‍ර I** කාලය පැය තුනයි

**I පත්‍රය** - කාලය : පැය **03**යි. (ඊට අමතරව කියවීම් කාලය මිනිත්තු 10 යි.)
මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත වේ.
I කොටස - වරණ 5 බැගින් වූ බහුවරණ ප්‍රශ්න **40කි.** ප්‍රශ්න **සියල්ලට** ම පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු **01** බැගින් ලකුණු **40කි.**
II කොටස - මෙම කොටස අනුකොටස් **තුනකින්** සමන්විත වේ.
"අ" කොටස - සංස්කෘතික පසුබිම හා රසවින්දනය - ශ්‍රී ලංකාව ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න **තුනකි.**
"ආ" කොටස - සංස්කෘතික පසුබිම හා රසවින්දනය - ඉන්දියාව ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න **දෙකකි.**
"ඉ" කොටස - සංස්කෘතික පසුබිම හා රසවින්දනය - යුරෝපය ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න **දෙකකි.**
"අ" කොටසින් ප්‍රශ්න දෙකක් හා "ආ", "ඉ" යන කොටස් දෙකෙන් **එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගින් ලකුණු 60 කි.
I පත්‍රයට මුළු ලකුණු ප්‍රමාණය - ලකුණු 100කි.

**II පත්‍රය** - කාලය : පැය **03**යි. මුළු ලකුණු **100**කි.
ද්‍රව්‍ය බලා ඇඳීම සඳහා යොමු කරවන **එක්** ප්‍රශ්නයක් පමණක් ඇතුළත් ප්‍රශ්න පත්‍රයකි.

**III පත්‍රය** - කාලය : පැය **03**යි. මුළු ලකුණු **100**කි.
මෙය "අ", "ආ" හා "ඉ" ලෙස කොටස් තුනකින් සමන්විත වේ.
"අ" කොටස - චිත්‍ර සංරචනය මාතෘකා 04 යි.
"ආ" කොටස - මෝස්තර නිර්මාණය මාතෘකා 03 යි.
"ඉ" කොටස - ග්‍රැෆික් චිත්‍ර නිර්මාණ මාතෘකා 03 යි.
මෙම කොටස් තුනෙන් එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන එක් වර්ණ චිත්‍රයක් පමණක් නිර්මාණය කළ යුතු වේ.

අවසාන ලකුණු ගණනය කිරීම :

| | | |
|---|---|---|
| I පත්‍රය | = | 100 |
| II පත්‍රය | = | 100 |
| III පත්‍රය | = | 100 |
| අවසාන ලකුණු | = | 300 ÷ 3 = 100 |

**සැලකිය යුතුයි :**

## I කොටස

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට **වඩාත් යෝග්‍ය** පිළිතුර පහත සඳහන් **A, B, C, D, E** යන ඡායාරූප ඇසුරින් තෝරන්න.



**A**




**B**



**C**



**D**



**E**

01. A අක්ෂරයෙන් දැක්වෙන කැටයම සම්බන්ධව මහාචාර්ය සෙනරත් පරණවිතානයන් දක්වන අදහස වන්නේ,
1. අසරුවෙකු නිරූපණය වන බව ය.
2. යුධ සෙබළකු නිරූපණය වන බව ය.
3. අග්නි සහ පර්ජන්‍ය නිරූපණය වන බව ය.
4. කපිල ඍෂිවරයා නිරූපණය වන බව ය.
5. අභිනිෂ්ක්‍රමණය නිරූපණය වන බව ය. (.......)

02. B අක්ෂරයෙන් දැක්වෙන කැටයම් හමුවන්නේ,
1. ගඩලාදෙණිය පිළිමගෙය ප්‍රවේශ මණ්ඩපයේ පාදමෙහි ය.
2. යාපහුව දළදා මාළිගය පිය ගැට පෙළ ප්‍රවේශය දෙපස ය.
3. ගඩලාදෙණිය පිළිමගෙයි ද්වාරය දෙපස ය.
4. පොළොන්නරුව හැටදාගෙයි ප්‍රවේශ මණ්ඩපයේ බොරදම් තීරු අතර ය.
5. යාපහුව දළදා මාළිගෙය ද්වාර මණ්ඩපයේ පාදමෙහි ය. (.......)

03. C අක්ෂරයෙන් නිරූපිත කැටයම,
1. ස්වභාවිකත්වයට වඩා සංකල්පීය ලක්ෂණ පෙන්වයි.
2. සියම්, මටසිලිටි කමනීය ලාලිත්‍යමය ස්වභාවයෙන් හා සජීවී බවින් යුක්ත ය.
3. ස්වභාවිකත්යට වඩා අර්ධ තාත්වික බව කින් යුතුය.
4. යථාර්ථවාදී ලක්ෂණයන්ගෙන් යුතුය.
5. පරිකල්පනීය ලක්ෂණයන්ගෙන් යුතුය. (.......)

04. D අක්ෂරයෙන් දැක්වෙන කැටයමින් නිරූපණය වන්නේ,
1. ට්‍රැජන් අධිරාජ්‍යයාගේ ඩේසියානු යුද්ධයේ අවස්ථාවකි.
2. මහා ඇලෙක්සැන්ඩර් අධිරාජයාගේ පෙරදිග ආක්‍රමණයේ අවස්ථාවකි.
3. මෝසස් විසින් පෙරොන්දු වූ දේශය වෙත වහලුන් කැඳවාගෙන යන අවස්ථාවකි.
4. ටයිටස් අධිරාජ්‍යයාගේ ජෙරුසෙලම වටලෑම නම් සිදුවීමයි.
5. ඩේරියස් අධිරාජ්‍යයා හා ඇතැන්ස් හමුදාව අතර ඇති වූ සටනේ අවස්ථාවකි. (.......)

05. E අක්ෂරයෙන් දැක්වෙන කැටයමින් නිරූපණය වන්නේ,
1. ආකාශ ගංගාවරෝහනය නම් හින්දු පුරාවෘත්තයයි.
2. දුර්ගා විසින් අසුරයින් පැන්වීමයි.
3. රාවණා විසින් කෛලාසකූටය සෙලවීමයි.
4. හින්දු ආගමේ විශ්ණු, ශිව,පාර්වතී යන ත්‍රිමූර්තියයි.
5. ශිව පාර්වතී විවාහයයි. (.......)

◆ අංක 6 සිට 10 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් නිවැරදි** පිළිතුර තෝරන්න.

06. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික සිතුවම් අතුරින් 'ඇතා සහ පැටවා' සිතුවම දක්නට ලැබෙන්නේ,
1. තන්තිරිමලේ ය.
2. බටදොඹ ලෙනෙහි ය.
3. දොරවක ලෙනෙහි ය.
4. බිල්ලෑව ලෙනෙහිය.
5. ගොනාගොල්ල ලෙනෙහි ය. (.......)

07. ඝනික වාදී කලා ව්‍යාපාරය තුළ හැඩතල භාවිතයේදී,
1. සරල හැඩතල ඇසුරින් ප්‍රකාශනය ගොඩනගා ඇත.
2. විවිධ හැඩතල සම්මිශ්‍රිතව භාවිතා කොට ඇත.
3. ජ්‍යාමිතික හැඩ ප්‍රබලව ප්‍රකාශනයට භාවිතා කර ඇත.
4. ස්වභාවිකවාදී හැඩතල ඇසුරින් තාත්වික ලෝකය නිරූපණය කොට ඇත.
5. මූලික ගණිතමය හැඩතල භාවිතා කර ඇත. (.......)

08. අවිඥානිකත්වයේ සහ අතාර්කිකත්වයේ මූලයන්ගෙන් පැන නැගුණු පරිකල්පනීය අරමුණු මූලික කොටගත් කලා ව්‍යාපාරය වන්නේ,
1. අධියථාර්ථවාදය
2. ඝනිකවාදය
3. අලංකාරවාදය
4. යථාර්ථවාදය
5. පෙරදිගවාදය (.......)

09. අජන්තා, එල්ලෝරා, භාග් මෙන්ම ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය චිත්‍ර කලාව ගුරු කොටගත් චිත්‍ර ශිල්පියා,
1. ඒ.සී.ජී.එස්. අමරසේකර ය. 2. ජේ.ඩී.ඒ. පෙරේරා ය. 3. ජෝර්ජ් කීට් ය.
4. එම්. සාර්ලිස් ය. 5. සෝලියස් මෙන්දිස් ය. (.......)

10. භාරුත් කැටයම් අතර නිරූපික ජාතක කථාවක් වන්නේ,
1. අපන්නක ජාතකය 2. රුරු මිග ජාතකය 3. වෙස්සන්තර ජාතකය
4. ෂද්දන්ත ජාතකය 5. උරග ජාතකය (.......)

◆ අංක 11 සිට 15 තෙක් අසා ඇති ප්‍රශ්න වලට **වඩාත් නිවැරදි** පිළිතුර පහත 1 සිට 9 දක්වා ඇති රූප ඇසුරු කරගෙන තෝරන්න.


1


2


3


4


5


6


7


8


9

11. පරමාදර්ශී මානව රුව ලක්ෂණ සහිත ඡායාරූප වන්නේ,
1. 6,8 2. 4,6 3. 2,4 4. 1,3 5. 1,4 (.......)

12. රාජකීය චරිත නිරූපිත ඡායාරූප වන්නේ,
1. 2,4,9 2. 3,5,1 3. 1,6,8 4. 6,7,1 5. 2,5,8 (.......)

13. ඉන්දීය ගුප්ත කලා ලක්ෂණ සහිත කලා කෘතිය වන්නේ,
1. 1 2. 3 3. 5 4. 4 5. 6 (.......)

14. ආගමික සංකල්ප නිරූපිත කලා කෘති වන්නේ,
1. 1,2 2. 3,4 3. 5,7 4. 6,7 5. 5,3 (.......)

15. ග්‍රීක මිත්‍යා කථාවක් ඇසුරින් නිම වූ මූර්තියක ඡායාරූපයක් දැක්වෙන්නේ,
1. 5 2. 1 3. 3 4. 2 5. 4 (.......)

◆ ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් නිවැරදි** පිළිතුර තෝරන්න.

16. 43 කණ්ඩායම සඳහා වැඩි බලපෑමක් එල්ලවන්නේ,
1. ඇමරිකාවේ නිව්යෝක් නගරය කේන්ද්‍ර කොටගෙන බිහි වූ ව්‍යූක්ත කලාවෙනි.
2. එංගලන්තයේ ශාස්ත්‍රාලීය යථාර්ථවාදයෙනි.
3. ප්‍රංශයේ පැරිස් නගරය කේන්ද්‍ර කොටගෙන ඇති වූ නූතන කලා ප්‍රවණතාවන්ගෙනි.
4. ඉතාලියේ ෆ්ලොරන්ස් නගරයේ ඇති වූ පුනරුද කලාවෙනි.
5. ග්‍රීක රෝම සම්භාව්‍ය කලාවෙනි. (.......)

17. සාංචි තොරණ කැටයම්වල දක්නට ලැබෙන සංකස්ස පුරයට වැඩීම නැමති කැටයමේ බුදුන් සංකේතවත් කොට ඇත්තේ,
1. බෝධියක් දැක්වීමෙනි. 2. සිරිපතුල දැක්වීමෙනි. 3. චෛත්‍යයක් දැක්වීමෙනි.
4. ආසනයක් දැක්වීමෙනි. 5. ඡත්‍රයක් දැක්වීමෙනි. (.......)

18. එක් ඇසකින් වස්තුවක් නිරීක්ෂණය කර පෙනෙන පර්යාවලෝකය වෙනුවට ඇස් දෙකෙන්ම වස්තු නිරීක්ෂණයේදී ගෝචර වන ද්වි ගුණ දෘෂ්ටියට අනුව පර්යාවලෝකය ගොඩනගන ලද්දේ,
1. පැබ්ලෝ පිකාසෝ 2. වසිලි කැන්ඩිනිස්කි. 3. ජැක්සන් පොලොක්
4. පෝල් සෙසාන් 5. වින්සන්ට් වැන්ගෝ (.......)

19. චිත්‍රයක මානව වාදී (Humanism) ලක්ෂණ අවධාරණය කරන ලද්දේ,
 1. පශ්චාත් උපස්ථිතිවාදයෙනි. 2. යථාර්ථවාදයෙනි. 3. පුනරුද ශිල්පීන්ය.
 4. උපස්ථිතිවාදයෙනි. 5. ඝණිකවාදයෙනි. (.......)

20. පර්සියානු ස්ථම්භයකින් අශෝක ස්ථම්භ වෙනස් වන ඉන්දියාවට ආවේනික ලක්ෂණයක් වන්නේ,
 1. ගොඩනැගිලි අංගයක් ලෙස භාවිතා වීමයි.
 2. හිස කඳ හා පාදම වශයෙන් කොටස් තුනකින් යුක්ත වීමයි.
 3. කඳ කොටසේ දාර හැඩ යොදා තිබීමයි.
 4. තනි කුළුණක් ලෙස නොව කොටස් එක්කොට නිම කිරීමයි.
 5. ස්වාධීන අංගයක් වශයෙන් ස්මාරකීය ලක්ෂණ සහිතව ගොඩනගා තිබීමයි. (.......)

◆ අංක 21 සිට 25 තෙක් ප්‍රශ්න වලට ඊට ඉදිරියෙන් ඇති වාස්තු විද්‍යා නිර්මාණ ඇසුරින් **වඩාත් නිවැරදි** පිළිතුර තෝරන්න.

21. යාපහුව මාලිගය හා බලකොටුව ඡායාරූපයේ දැක්වේ මෙහි ශේෂ වී ඇති ඉදිකිරීම්,

 1. ආරක්ෂක කටයුතු සඳහා යොදාගෙන ඇත.
 2. වාසස්ථාන සඳහා යොදාගෙන ඇත.
 3. ආගමික කටුයතු සඳහා යොදාගෙන ඇත.
 4. ඉහත කරුණු සියල්ලම සඳහා යොදාගෙන ඇත.
 5. ඉහත කරුණු සියල්ලම සඳහා යොදාගෙන නැත. (.......)

22. ඡායාරූපයේ දැක්වෙන බෝධිඝරය,

 1. පඬුවස්නුවර බෝධිඝරයයි.
 2. කුරුණෑගල නිල්ලක්ගම බෝධිඝරයයි.
 3. ලාහුගල මඟුල් මහා විහාර බෝධිඝරයයි.
 4. හම්බන්තොට පඩිකෙම්ගල බෝධිඝරයයි.
 5. හුණුපිටිය ගංගාරාමයේ බෝධිඝරයයි. (.......)

23. මෙහි දැක්වෙන්නේ ග්‍රීසියේ පාර්තිනොන් දේවස්ථානයයි. එහි,

 1. බාහිරින් ඩොරික් කුළුණු පේලියක් දක්නට ලැබේ.
 2. බාහිරින් කොරින්තියන් කුළුණු පේලියක් දක්නට ලැබේ.
 3. බාහිරින් අයෝනික් කුළුණු පේලියක් දක්නට ලැබේ.
 4. බාහිරින් ඩොරික් මෙන්ම අයෝනික් කුළුණු පේලියක් දක්නට ලැබේ.
 5. බාහිරින් ඩොරික් මෙන්ම කොරින්තියන් කුළුණු පේලියක් දක්නට ලැබේ. (.......)


24. මෙහි දැක්වෙන අශෝක ස්ථම්භ ශීර්ෂය,

 1. ලුම්බිණි ප්‍රදේශයෙන් හමුවේ. 2. සාංචි ප්‍රදේශයෙන් හමුවේ.
 3. ලෞර්යා නන්දන්ගර් ප්‍රදේශයෙන් හමුවේ. 4. සාරනාත් ප්‍රදේශයෙන් හමුවේ.
 5. රාම්පූර්වා ප්‍රදේශයෙන් හමුවේ. (.......)

25. මෙහි දැක්වෙන මිසරයේ අබුසිම්බල් දේවස්ථානයේ ඉදිරිපස දක්නට ලැබෙන මූර්ති 04,

 1. ටූටන් කාමන් රජුගේ යැයි සැලකේ. 2. II රැම්සස් රජුගේ යැයි සැලකේ.
 3. නර්මේර් රජුගේ යැයි සැලකේ. 4. අක්නේටන් රජුගේ යැයි සැලකේ.
 5. රහොටෙප් රජුගේ යැයි සැලකේ. (.......)

◆ අංක 26 සිට 30 තෙක් අසා ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් නිවැරදි පිළිතුර** පහත සඳහන් **F, G, H, I, J** ලෙස නම්කර ඇති මූර්ති ඇසුරෙන් තෝරන්න.


**F**


**G**


**H**


**I**


**J**

26. F අක්ෂරයෙන් දැක්වෙන මියයන ගෝල් වරයා නම් මූර්තියෙන්
1. සම්භාව්‍ය යුගයේ නිතර භාවිතා වන ආකෘතියක් දක්නට ලැබේ.
2. සම්භාව්‍ය යුගයේ පරමාදර්ශී ශරීරය ඒ අයුරින්ම ඉදිරිපත් කර ඇත.
3. සම්භාව්‍ය යුගයේ පරමාදර්ශී ශරීර ස්වභාවය වෙනස්ව ඉදිරිපත් කරයි.
4. සම්භාව්‍ය යුගයේ දක්නට ලැබෙන විෂයාත්මක ඉරියව් දක්නට ලැබේ.
5. ඉහත කරුණු සියල්ලම අසත්‍ය වේ. (.......)


27. G අක්ෂරයෙන් දැක්වෙන සාරානාත් බුද්ධ ප්‍රතිමාවෙහි,
1. භද්‍රාසන ක්‍රමය හා ධම්මචක්ක මුද්‍රාව දැක්වේ.
2. මහාරාජ ලීලාසන ක්‍රමය හා ධම්මචක්ක මුද්‍රාව දැක්වේ.
3. වීරාසන ක්‍රමය හා විතර්ක මුද්‍රාව දැක්වේ.
4. පද්මාසන ක්‍රමය සහ ධම්මචක්ක මුද්‍රාව දැක්වේ.
5. වීරාසන ක්‍රමය සහ ධම්මචක්ක මුද්‍රාව දැක්වේ. (.......)

28. H අක්ෂරයෙන් දැක්වෙන ලියන්නා නමැති මූර්තිය,
1. ස්වභාවිකවාදී ලක්ෂණ පෙන්වයි.
2. ව්‍යුක්ත ලක්ෂණ පෙන්වයි.
3. සරල ලක්ෂණ පෙන්වයි.
4. සාම්ප්‍රදායික ලක්ෂණ පෙන්වයි.
5. සාම්ප්‍රදායික ලක්ෂණ මෙන්ම ව්‍යුක්ත ලක්ෂණ පෙන්වයි. (.......)

29. I අක්ෂරයෙන් දක්නට ලැබෙන අවුකන ප්‍රතිමාව,
1. පල්ලව කලා ලක්ෂණ පෙන්වයි.
2. ගුප්ත කලා ලක්ෂණ පෙන්වයි.
3. ගන්ධාර කලා ලක්ෂණ පෙන්වයි.
4. මථුරා කලා ලක්ෂණ පෙන්වයි.
5. අමරාවතී කලා ලක්ෂණ පෙන්වයි. (.......)

30. J අක්ෂරයෙන් දැක්වෙන මූර්තිය,
1. සෝමස්කන්ධ මූර්ති නමින් හඳුන්වයි.
2. අර්ධනාරී නටේශ්වර නමින් හඳුන්වයි.
3. මාලාතාරා නමින් හඳුන්වයි.
4. පාර්වතී නමින් හඳුන්වයි.
5. ශිවගේ අවතාරයක් ලෙසින් හඳුන්වයි. (.......)

◆ අංක 31 සිට 35 දක්වා අසා ඇති ප්‍රශ්නවලට **වඩාත් නිවැරදි** පිළිතුර **K, L, M, N, O** ලෙස නම් කර ඇති පහත සඳහන් චිත්‍ර ඇසුරින් තෝරන්න.


**K**


**L**


**M**


**N**


**O**

31. K අක්ෂරයෙන් දැක්වෙන සිතුවම ඇඳි ශිල්පියා,
1. එල්.ටී.පී. මංජුශ්‍රී ය.
2. ඩබ්.ජේ. බීලිං ය.
3. අයිවන් පීරිස් ය.
4. හැරී පීරිස් ය.
5. ජස්ටින් දැරණියගල ය. (.......)

32. L අක්ෂරයෙන් දැක්වෙන නාට්‍යාංගනාවෝ සහ සංගීතඥයෝ නමැති මෙම සිතුවම,
1. නොබාමුන් නැමැති සෙහොන් ගැබින් හමුවේ.
2. ඉටෙට් වංශාධිපතියාගේ සොහොන් ගැබින් හමුවේ.
3. ටූටන් කාමන් රජුගේ සොහොන් ගැබින් හමුවේ.
4. හට්ෂෙප්ෂුට් දේවස්ථානයේ සොහොන් ගැබින් හමුවේ.
5. ලක්සෝර් දේවස්ථානයේ සොහොන් ගැබින් හමුවේ. (.......)

33. M අක්ෂරයෙන් දැක්වෙන නිල්කාමරය නමැති සිතුවම ඇඳි මේරි කසාට් නැමැති චිත්‍ර ශිල්පිනිය,
1. පෙරදිග ශෛලීන් අනුව ඇඳි අපරදිග ශිල්පිනියකි.
2. ශාස්ත්‍රාලීය කලා නියමයන්ට අනුව ඇඳි ශිල්පිනියකි.
3. උපස්ථිතිවාදී කලා ප්‍රවණතාවට අයත් ශිල්පිනියකි.
4. පශ්චාත් උපස්ථිතිවාදී ප්‍රවණතාවට අයත් ශිල්පිනියකි.
5. යථාර්ථවාදී ප්‍රවණතාවයට අයත් ශිල්පිනියකි. (.......)

34. N අක්ෂරයෙන් දක්නට ලැබෙන සිතුවමින්,
1. උඩරට ශෛලීය ලක්ෂණ පෙන්වයි.
2. පහතරට ශෛලීය ලක්ෂණ පෙන්වයි.
3. පෙරදිග සම්භාව්‍ය ශෛලිය ලක්ෂණ පෙන්වයි.
4. උඩරට මෙන්ම පහතරට ශෛලීය ලක්ෂණ නොපෙන්වයි.
5. පහතරට ශෛලීය ලක්ෂණ මෙන්ම ඉන්දීය කලා ලක්ෂණ පෙන්වයි. (.......)

35. O අක්ෂරයෙන් දැක්වෙන පැබ්ලෝ පිකාසෝගේ ''වැලපෙන කත'' නම් සිතුවම,
1. විශ්ලේෂණාත්මක අවධියේ සිතුවමකි.
2. රෝස යුගයේ සිතුවමකි.
3. නිල් යුගයේ සිතුවමකි.
4. සනිකවාදී යුගයේ සිතුවමකි.
5. අප්‍රිකානු බලපෑම සහිත යුගයේ නිර්මාණයකි. (.......)

◆ අංක 36 සිට 40 දක්වා ප්‍රශ්න වලට **වඩාත් නිවැරදි** පිළිතුර පහත සඳහන් චිත්‍රය ඇසුරින් තෝරන්න.



36. මෙම සිතුවම,
1. වින්සන්ට් වැන්ගෝ ශිල්පියාගේ කෘතියකි.
2. පෝල් සෙසාන් ශිල්පියාගේ කෘතියකි.
3. එඩ්ගා ඩෙගා ශිල්පියාගේ කෘතියකි.
4. පෝල් ගොගැන් ශිල්පියාගේ කෘතියකි.
5. මේරි කසාට් ශිල්පිණියගේ කෘතියකි. (.......)

37. මෙම සිතුවම සඳහා,
1. කාර්මීකරණය පිළිබඳ සාකච්ඡා කරමින් කාඩ් සෙල්ලම් කරන පිරිසක් විෂයවී ඇත.
2. රහසිගත සාකච්ඡාවක් සඳහා එකතුවූ පිරිසක් විෂය වී ඇත.
3. සාදයක් සඳහා එකතු වූ පවුලේ අවස්ථාවක් විෂය වී ඇත.
4. කාර්මීකරණයේ ප්‍රතිඵල ලෙස දුෂ්කර ජීවිතයක් ගතකරන ගොවිපවුලක් විෂය වී ඇත.
5. කාර්මීකරණය තුළ ප්‍රීතිමත් ජීවිතයක් ගත කරන ගොවි පවුලක් විෂය වී ඇත. (.......)

38. මෙම සිතුවම,
1. කාඩ් සෙල්ලම් කරන්නෝ නමින් හඳුන්වයි.
2. දාම් අදින පිරිසක් නමින් හඳුන්වයි.
3. රහස් සාකච්ඡාව නමින් හඳුන්වයි.
4. පවුලේ හමුව නමින් හඳුන්වයි.
5. අර්තාපල් බුදින්නෝ නමින් හඳුන්වයි. (.......)

39. මෙම සිතුවමේ දෘෂ්ටිය වන්නේ,
1. මානව ජීවිත අරගලය රසවින්දනාත්මකව ඉදිරිපත් කිරීමයි.
2. මානව ජීවිතය පිළිබඳව නව අදහසක් ඉදිරිපත් කිරීමයි.
3. මානව ජීවිතය දෙස සානුකම්පිතව බැලීමයි.
4. මානව ජීවිතය දෙස ප්‍රීතිමත් සිතකින් බැලීමයි.
5. මානව ජීවිතය දෙස තාර්කිකව බැලීමයි. (.......)

40. මෙම චිත්‍රය අයත් වන්නේ,
1. යථාර්ථවාදී කලා ප්‍රවණතාවයට ය.
2. අධි යථාර්ථවාදී කලා ප්‍රවණතාවයට ය.
3. පශ්චාත් උපස්ථිතිවාදී කලා ප්‍රවණතාවයට ය.
4. රොමෑන්තිකාවදී කලා ප්‍රවණතාවයට ය.
5. උපස්ථිතිවාදී කලා ප්‍රවණතාවයට ය. (.......)

# 13 ශ්‍රේණිය - චිත්‍ර I

## II කොටස

- මෙය අනු කොටස් තුනකින් සමන්විතය.
- ''අ'' කොටසින් ප්‍රශ්න දෙකක් හා ''ආ'' ''ඉ'' යන කොටස් දෙකෙන් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

  (අවශ්‍ය තැන්හි පිළිතුරු සචිත්‍ර කිරීම ඔබට වාසිදායක වේ)

## 'අ' කොටස

## සංස්කෘතික පසුබිම හා රසාස්වාදය

### ශ්‍රී ලංකාව

01. ක්‍රි.ව. 1271 - 1283 දක්වා බුවනෙකබාහු රාජ්‍ය සමය තුළ ඉදි වූ යාපහුව රාජධානිය උදාර වූ හෙළ උරුමයකි. අලංකාරය හා ආරක්ෂක උපක්‍රම සහිතව ගොඩ නගන ලද මෙහි අගනා වාස්තු විද්‍යා අංග හා කැටයම් රාශියක් සහිතය.

    i. යාපහුවේ දැනට ශේෂව ඇති වාස්තු විද්‍යා නිර්මාණ අංග නම් කරන්න. (ලකුණු 02 යි)

    ii. මෙම වාස්තු විද්‍යා නිර්මාණ අංග පිළිබඳ සුවිශේෂ කරුණු කීපයක් සඳහන් කරන්න. (ලකුණු 05 යි)

    iii. පුන් කලස් අත තබා ගත් කාන්තා රූප හා නටන වයන කාන්තා රූප ඇසුරින් යාපහු ශිල්පියා කාන්තා රූ කැටයම් කිරීමේදී දක්වා ඇති කුසලතා පිළිබඳ ඇගයීමක් කරන්න. (ලකුණු 08 යි)

02. අනුරාධපුර හා පොළොන්නරු යුගවල විවිධ හස්ත මුද්‍රා සහිතව, විවිධ ක්‍රම ශිල්ප අනුව, ලෝකඩ මූර්ති නිර්මාණ කර ඇත.

    i. අනුරාධපුර යුගයේ අවසාන කාලයට අයත් ලෝහ ප්‍රතිමා දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

    ii. ''දැදිගම කොට වෙහෙර ඇත් පහන'' නමින් හඳුන්වන පිත්තල පහන පිළිබඳ කෙටි විග්‍රහයක් කරන්න. (ලකුණු 05 යි)

    iii. ශිව දෙවියන්ගේ තාණ්ඩව නර්තන විලාශය පෙන්නුම් කරන අග්‍ර ගණ්‍ය කලා නිර්මාණයක් වූ නටරාජ ප්‍රතිමාවේ මාධ්‍යය, ශිල්ප ක්‍රමය හා හස්ත මුද්‍රා ආදිය පිළිබඳ විමසමින්, එහි කලාත්මක අගය පිළිබඳ රස වින්දනාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු 08 යි)

03. 43 කණ්ඩායම ශ්‍රී ලංකීය ප්‍රථම නූතනවාදී කලා ව්‍යාපාරයයි. එම කණ්ඩායමේ වැදගත්ම දායකත්වය වන්නේ බහු ශෛලීය කලා ලක්ෂණ පිළිබඳ විශ්වාසය ශ්‍රී ලාංකේය නූතන කලා ක්ෂේත්‍රයෙහි ස්ථාපිත කිරීමයි.

    i. 43 කණ්ඩායමේ සාමාජිකයන් දෙදෙනෙකු වන හැරී පීරිස් හා අයිවන් පීරිස් දෙදෙනාගේ කලා කෘති එක බැගින් නම් කරන්න. (ලකුණු 02 යි)

    ii. 43 කණ්ඩායමේ ප්‍රකාශනාත්මක චිත්‍ර ශිල්පියා වූ ජස්ටින් දැරණියගලගේ රන් මාළුවා සහ ගැහැනු ළමයා සිතුවම පිළිබඳ කෙටි විස්තරයක් සපයන්න. (ලකුණු 05 යි)

    iii. 43 කණ්ඩායමේ එක් එක් ශිල්පියාගේ නිර්මාණ ඇසුරින් එකිනෙකාගේ චිත්‍ර ශෛලිය හා මාධ්‍ය භාවිතයේ ප්‍රභල බව පිළිබඳව ඇගයීමක් කරන්න. (ලකුණු 08 යි)

## 'ආ' කොටස

# සංස්කෘතික පසුබිම හා රසාස්වාදය

### ඉන්දියාව

04. පල්ලව කලා සම්ප්‍රදාය ස්වභාවිකවාදී ශෛලියකින් යුක්ත දකුණු ඉන්දීය කලා සම්ප්‍රදායකි. හින්දු ආගමික පසුබිම මත වැඩුණු මෙම කලා සම්ප්‍රදාය කන්චිපුරම් නගරය කේන්ද්‍රකොට ගෙන ගොඩනැගුණි.

i. පල්ලව වාස්තු විද්‍යාව ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි. එම කොටස් දෙක නම් කරන්න. (ලකුණු 02 යි)

ii. ක්‍රි.ව. 07 වැනි සියවසේ මැද නොහොත් පසු කාලයට අයත් යයි සැලකෙන 'පංච පාණ්ඩව රථ' පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ලකුණු 05 යි)

iii. තමිල්නාඩු ප්‍රාන්තයේ මාමල්ලපුරම්හි පිහිටුවා ඇති පල්ලව කලා සම්ප්‍රදායේ කැටයම් වලින් හින්දු ආගමික විශ්වාස නිරූපණය වේ. මෙහි පිහිටා ඇති ආකාශ ගංගාවරෝහණය කැටයමේ නෙලා ඇති මිනිස් රූප, සත්ව රූ, දේවතා ආකෘති හා සියළු කැටයම් වල උචිත බව, කලාත්මක අගය පිළිබඳ විමසුමක් කරන්න. (ලකුණු 08 යි)

05. භාරතය වසර දහස් ගණනකට පෙර සිටම උදාර චිත්‍ර කලා සම්ප්‍රදායකට උරුමකම් ලැබූ දේශයකි. යුරෝපීය ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී රීතීන්ට එරෙහිව ඉන්දීය හා පෙරදිග කලා රීති අනුගමනය කරමින් ඉන්දීය නව ජීවන ව්‍යාපාරය බිහි විය.

i. ඉන්දීය නව ජීවන ව්‍යාපාරයේ පුරෝගාමී සිත්තරුන්ගෙන් අයෙකු වූ නන්දලාල් බෝස් ශිල්පියාගේ නිර්මාණ දෙකක් හා බෙංගාලි ගුරු කුලයේ පුරෝගාමී සිත්තරකු වූ අබනීන්ද්‍රානාත් තාගෝර් ශිල්පියාගේ චිත්‍ර නිර්මාණ දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

ii. 'සියුම් ප්‍රාණ පූර්ණ රේඛාවකින් සැදුණ පෙරදිග චිත්‍ර කලාවේ වර්ණ රටාවන්ගේ හරය තේරුම්ගත් අබනීන්ද්‍රනාත් තාගෝර් තමාගේම සම්ප්‍රදායක් ගොඩනගා ගත් ශිල්පියෙකි.' කෙටි විමසුමක් කරන්න. (ලකුණු 05 යි)

iii. භාරතය තුළ බිහිවූ කීර්තිමත් චිත්‍ර ශිල්පීන් අතර ප්‍රකට, කීර්තිමත් චිත්‍ර ශිල්පී ජෙමිනි රෝයි හා අම්රිතා ශේර් ගිල් ශිල්පිනියගේ නිර්මාණ පිළිබඳ විචාරාත්මක විමසුමක් කරන්න. (ලකුණු 08 යි)

## 'ඉ' කොටස

# සංස්කෘතික පසුබිම හා රසාස්වාදය

### යුරෝපය

06. මධ්‍යධරණී මුහුද ආශ්‍රිතව පැවති රෝම අධිරාජ්‍ය ඉතා විශාල ප්‍රදේශයක් පුරා පැතිර පැවති අභිමානවත් දේශයකි. චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ යන කලාවන්ගෙන් පෝෂණය වූවකි. ග්‍රීසියේ බිඳ වැටීමත් සමඟ එම කලා කෘති අනුගමනය කරමින් පෝෂණය වූ රෝම කලාව ග්‍රීසිය අභිබවා යාමට සමත් වූ බවට ඉතිහාසය සාක්ෂි දරයි.

i. රෝම අධිරාජ්‍යවරුන්ගේ යුද ජයග්‍රහණ සැමරීමේ ස්මාරක ලෙස ඉදි කරන ලද විජයග්‍රහණ ආරුක්කු, විජයග්‍රහණ පිළිබඳ මතක සටහන් ඇතුලත් ප්‍රචාරක පුවරු මෙනි. රෝම විජයග්‍රහණ ආරුක්කු දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

ii. රෝම විජයග්‍රහණ ආරුක්කු වල කැටයම් පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න. (ලකුණු 05 යි)

iii. ග්‍රීක මූර්ති පරමාදර්ශී දිව්‍යමය සුන්දරත්වය මතුවන සේ නිර්මාණය කළද, රෝම මූර්ති, මනුෂ්‍යත්වය, හා ස්වභාවිකත්වය පදනම් කොට ගෙන නිර්මාණය කර ඇත. මාධ්‍යයේ ස්වභාවය පුද්ගලයාගේ ස්වභාවය හා කලාකරුවාගේ හැකියාව ආදී කරුණු සුසංයෝගය, ජුලියස් සීසර් හා කැරකැල්ලා විද්ධ මූර්ති වලින් පිළිබිඹු වන අයුරු විමසන්න. (ලකුණු 08 යි)

07. උපස්ථිතිවාදී තේමා හා ශිල්ප ක්‍රම කාලයත් සමඟ ඒකාකාරීත්වයට පත්වෙමින් තිබූ අතර, එයට විරුද්ධ ප්‍රතික්‍රියාවක් ලෙස පශ්චාත් උපස්ථිතිවාදී කලා ව්‍යාපාරය බිහි විය. උපස්ථිතිවාදයේ තිබූ සීමා අතික්‍රමණය කිරීමේ අරමුණෙන් පැන නැගුණු කලා ව්‍යාපාරයක් ලෙස පශ්චාත් උපස්ථිතිවාදය සැලකිය හැකිය.

i. පශ්චාත් උපස්ථිතිවාදී ශිල්පියෙකු වූ වින්සන්ට් වැන් ගෝ ගේ සිතුවම් දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

ii. වින්සන්ට් වැන්ගෝ ගේ සිතුවම් පිළිබඳ ඔබ හඳුනාගත් අදහස් පෙළ ගස්වන්න. (ලකුණු 05 යි)

iii. පෝල් සෙසාන්ගේ කාඩ් සෙල්ලම් කරන්නෝ, ඉරිතැළුණු බිත්ති සහිත නිවස සිතුවම් ඇසුරෙන් ඔහුගේ නිර්මාණ කුසලතා පිළිබඳ ඇගයීමක් කරන්න. (ලකුණු 08 යි)

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

51 S III

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

**Second Term Test - Grade 13 - 2019**

විභාග අංකය ..................................   **චිත්‍ර III**   කාලය පැය තුනයි

උපදෙස් :-

- පහත සඳහන් 'අ' , 'ආ' සහ 'ඉ' කොටස් තුනෙන් එක් කොටසක් තෝරගන්න.
- එමකොටසේ එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන වර්ණ චිත්‍රයක් නිර්මාණය කරන්න.
- ඔබේ විභාග අංකය හා තෝරාගත් ප්‍රශ්න අංකය ඔබ චිත්‍රය අඳින කඩදාසියේ පසුපිටේ පැහැදිලි ව ලියන්න.
- චිත්‍රය භාර දෙන විට එය වියළී තිබීම වැදගත් ය.
- දිය සායම්, පෝස්ටර් සායම්, පැස්ටල්, කුඩු සායම් යන මාධ්‍ය මිශ්‍රිතව භාවිතා කිරීමට නිදහස ඇත.

## "අ" කොටස - චිත්‍ර සංරචනය

පහත සඳහන් මාතෘකාවලින් එකක් පමණක් තෝරගන්න.

01. කලබලකාරී නගරයක සාප්පු සංකීර්ණයක් ඉදිරිපිට ඔබ මොබ ගමන් ගන්නා සාප්පු සංචාරයේ යෙදී සිටින පිරිසක්
    හෝ
    නාගරික වීදියක් අසල පිහිටි බස්නැවතුම්පලක බසයක් එනතුරු බලාසිටින මගීන්

02. ගිලන් වූ කිරි ගවයෙකුට උපස්ථාන කරන කිරි කර්මාන්තයේ යෙදෙන ගැමි පවුලක්

03. නිවාසාන්තර ක්‍රීඩා උළෙලේ ජයග්‍රාහී නිවාසය ජය කුසලානය ලබාගන්නා උණුසුම් අවස්ථාවක්

04. දිය උල්පතකින් දිය ගෙනඒම සඳහා පැමිණි කාන්තාවෝ

## 'ආ' - මෝස්තර නිර්මාණය

01. ස්වර්ණාභරණ ආයතනයක් විසින් නව වසර සඳහා හඳුන්වා දීමට සූදානම් වන රත්‍රන් හා සුදු රත්‍රන් මිශ්‍රිතව නිමවන නවතම මෝස්තරයේ පදක්කම් කරමාලයක් සාම්ප්‍රදායික උද්භිද සැරසිලි ඒකක භාවිතා කර සැලසුම් කර වර්ණ ගන්වන්න.
02. ශ්‍රී ලංකාවේ පැරණි රාජධානි නටබුන් ස්ථාන නැරඹීම සඳහා සංචාරකයන් ප්‍රවාහනය කරන අභ්‍යන්තර ගුවන් සේවාවක ගුවන් සේවිකාවන් සඳහා සුදුසු ඇඳුමක් නිර්මාණය කරන්න.
03. උස් අතට විහිදී යන නිර්මාණාත්මක සත්ත්ව හැඩතල සහිත දොර රෙද්දක් සඳහා සුදුසු මෝස්තරයක් සැලසුම්කර වර්ණ කරන්න. / ස්වභාවික පලතුරු බීම අලෙවි සැලක පරිහරණය සඳහා සුදුසු නිර්මාණාත්මක හැඩයකින් යුතු මේස දරණුවක් සඳහා මුලුතල මෝස්තරයක් සැලසුම් කර වර්ණ ගන්වන්න.

## 'ඉ' ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය

පහත සඳහන් මාතෘකා වලින් එකක් පමණක් තෝරා ගන්න.

01. රජ මහා විහාරස්ථානයක සිදුකරන බෞද්ධ කුළ දරුවන් මහණ කිරීමේ වාර්ෂික පුණ්‍යෝත්සවය තේමා කර ගනිමින් විහාරාධිපති හිමියන් ප්‍රමුඛ විහාරස්ථ දායක සභාව වෙත යැවීමට සුදුසු ආරාධනා පත්‍රයක් නිර්මාණය කරන්න.

02. ''මව්පිය සෙනෙහස'' අරුත් ගන්වන නිසදැසක් සඳහා වර්ණවත් සන්නිදර්ශන චිත්‍රයක් නිර්මාණය කරන්න.

03. 'තාක්ෂණය ඵලදායීව භාවිතා කර පරිසරය සුරක්ෂිත කරමු' තේමාව අනුව පෝස්ටරයක් නිර්මාණය කරන්න. තේමාව අරුත් ගැන්වෙන සේ තේමා පාඨයක් ද යොදන්න.

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## දෙවන වාර පරීක්ෂණය - 2019 - 13 ශ්‍රේණිය
## චිත්‍ර කලාව I
## පිළිතුරු පත්‍රය

---

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | 3 | 11. | 4 | 21. | 4 | 31. | 4 |
| 2. | 5 | 12. | 1 | 22. | 2 | 32. | 1 |
| 3. | 2 | 13. | 5 | 23. | 1 | 33. | 3 |
| 4. | 4 | 14. | 3 | 24. | 5 | 34. | 2 |
| 5. | 1 | 15. | 2 | 25. | 2 | 35. | 4 |
| 6. | 3 | 16. | 3 | 26. | 3 | 36. | 1 |
| 7. | 3 | 17. | 1 | 27. | 4 | 37. | 4 |
| 8. | 1 | 18. | 4 | 28. | 1 | 38. | 5 |
| 9. | 5 | 19. | 3 | 29. | 5 | 39. | 3 |
| 10. | 2 | 20. | 5 | 30. | 2 | 40. | 3 |

**චිත්‍ර කලාව I පත්‍රය**
I කොටස **1 x 40 = 40**
**II** කොටස **60 = <u>60</u> = 100**

**I** පත්‍රය සඳහා = ලකුණු 100
**II** පත්‍රය = ලකුණු 100
**III** පත්‍රය = ලකුණු 100 = 300/3

II - පත්‍රය සඳහා පිළිතුරු
'අ' කොටස - ලංකා කලා ඉතිහාසය

01. (i) පියගැටපෙළ, පුන්කලස සහිත කාන්තා රූප, සිංහ රූප, උළුවහු, වා කවුළු කැටයම්

(ii)* ඉතිරිව ඇති වාස්තු විද්‍යා අංග අතර වඩාත් සුරක්ෂිතව ඇත්තේ පියගැටපෙළයි.
* ඔබ මට්ටම් කළ ගල් පුවරු සහිතයි.
* පර්වතය බෑවුම් සහිත බැවින් කොටස් කිහිපයකට ඉදිකර ඇත.
* පියගැටපෙළ දෙපස අලංකාර කැටයම් සහිතය.
* පළමු පියගැටපෙළ අවසානයේ ඇති සිංහ රූප යුගලය වලිගය ඔසවා නැඟී සිට පිම්මක් පනින ආකාරයට දක්වා ඇත.
* ශෛලිගත කේශර, විශාල ඇස්, පිටතට නෙරූ දත් කැපී පෙනේ.
* ගල් උළුවහු හා ගලින් කළ වා කවුළු ආශ්‍රිත කැටයම් සුවිශේෂ නිර්මාණයෝය.
* ලීස්තර, මෝස්තර බොරතුම් රටා සහ ගිල්ලුම් කුළුණු වලින් සැරසිලි කර ඇත.
* කවුළු වලට ඉහළින් මකර තොරණකි.

(iii) යාපහුවේ කැටයම් අතර ඇති විවිධ ඉරියව් ඉරියව් සහිත රූ සමූහය මගින් එකල රජවරුන් හා සාමාන්‍ය ජනයාගේ ජන ජීවිතය පිළිබඳ යම් අදහසක් ජනනය වේ. එකල ජනතාවගේ නැටුම්, ගැයුම් වැයුම් ආදි රසවින්දන අංග පිළිබඳ තිබූ ලැදියාව පිළිබඳ වටහා ගතහැකිය.
* යාපහුව පඩිපෙළ පහත කොටස දෙපස විමාන කාර හැඩ දෙකක් තුළ දොරටු පාලිකා රූ දෙකක් දක්නට ඇත.
* ත්‍රිභංග ඉරියව්වෙන් යුතු ය. එක් අතකින් පුන්කළසක් දරා අනෙක් අත කළවය මත තබාගෙන සිටී.
* මූලික ආකෘතිය මුරගල්වල නාරජ රූපයේ ඉරියව්වට සමානය. නාරි රුවේ ලාලිත්‍ය, කාන්තා රූපයක සිටගත් ඉරියව්වක ඇති කෝමළ ස්වරූපය, ශරීරයේ සෑම අංගයකම දැකියහැකි මුදු බව, ශරීරාංගවල ඇති ප්‍රාණවත් බව ආදිය ඉතා පැහැදිලිව දක්වා ඇත. සිහින් ඉඟ පිරිපුන් ලය හා උකුල් පෙදෙස සුමට බව හා මුදු බව මතු වන පරිදි කැටයම් කර තිබීම, යාපහු ශිල්පියාගේ කලා කුසලතා පැහැදිලිවම දැකිය හැකි අවස්ථාවකි. පොළොන්නරුවේ ලෝකඩ කැටයම් අතර ඇති පාර්වතී රුවේ ශරීර සුන්දරත්වයට සමාන වන අයුරකින් කාන්තා රුවේ සුන්දර බව ඔප් නංවා ඇත. පුළුල් උකුලෙහි පිරිපුන් බව මතුකරන ඉරියව්වකින් සිටගෙන සිටින ආකාරය ඉතාම ස්වභාවික අයුරින් කැටයම් කර ඇත. දෙඅත්හි ආභරණ සහිතය. කොණ්ඩය තරමක් ලොකුවට පැත්තට පෙනෙන සේ බැඳගෙන සිටින අයුරකින් නෙළා ඇත. කාන්තා ඉරියව්ව සුලලිතය.

* යාපහුවේ ශෛලමය පාදම ආශ්‍රිත කැටයම් අතර නටන වයන කාන්තා රූප ද තවත් වැදගත් නිරූපණයකි.
* ඇතැම් පිරිස් බෙර හා තාලම්පට වයන අතර, වාදන වලට අනුව නර්තනය යෙදෙන රූප දක්වා ඇත. නර්තන ඉරියව් උද්වේගකරය. අවකාශයේ ඇති ඉඩ අනුව මෙම කැටයම් ගලපාගෙන ඇති බවක් පෙනේ. බෙර වයමින් ම

නර්තන ඉරියව් දක්වන ආකාරය ද ඇත. එක් එක් රූපවලට ආරූඪ කර තිබෙන නර්තන විලාසය ප්‍රකාශනාත්මක ය.

* මෙම නර්තන හා වාදන සහිත කාන්තා රූපවල ඉරියව් ලාලිත්‍යමය හා නම්‍යශීලීව දැක්වීමට ශිල්පියා සමත්ව ඇත.

* කාන්තා රූපවල සුමට බව නාරි ලාලිත්‍ය මතු කරමින් ඉතා මනරම් ලෙස කැටයම් කිරීමේ දී යාපහු ශිල්පියා දක්වා ඇති කුසලතා සැබැවින්ම අගය කළ යුතුය.

02. (i) ජෛන භවන, ඉන්ද්‍රාණි, ආපසු ඒම, ගල්කිස්ස.

(ii)* කැන්වසය මත තෙල් සායමින් අඳින ලද චිත්‍රයකි.* වස්තුන්ගේ ප්‍රකෘති ස්වභාවය විකෘති කිරීම මෙහි දැකිය හැක.
* ශ්‍රී ලාංකීය නූතනවාදී කලාවේ ප්‍රකාශනවාදී කලාත්මක ප්‍රයෝග හඳුනාගැනීමට මෙම චිත්‍රය උපයෝගී කරගත හැකි ය.* විසංගත වර්ණ භාවිතය මගින් මෙම චිත්‍රයේ ප්‍රකාශනවාදී බව වැඩි කර ඇත.
* නූතනවාදී කලාවේ ප්‍රබල ප්‍රයෝගයක් වන වස්තුන්ගේ ප්‍රකෘති ස්වභාවය කලාකරුවාට අභිමත පරිදි විකෘති කිරීම නම් කලාත්මක ප්‍රයෝගය මෙම චිත්‍රයෙහි දැකිය හැක.

(iii)* 43 කණ්ඩායමේ ශිල්පීන්ගේ කුසලතා එකිනෙකා පරයමින් නැගී සිටින අයුරු ඔවුන්ගේ නිර්මාණ වලින් පැහැදිලි වේ.* ශාස්ත්‍රාලීය යථාර්ථවාදී කලා රීතිය භාවිතයෙන් මිදුණු ආලේඛ්‍ය චිත්‍ර ඇඳීමේ සම්ප්‍රදාය හා නූතන කලා ප්‍රයෝග ඇසුරින් භූමිදර්ශන ඇඳීම් සම්ප්‍රදාය ආදි සම්ප්‍රදායන් දෙකම හැරී පීරිස් ශිල්පියා විසින් භාවිතා කර තිබේ.
* ශ්‍රී ලාංකික නූතන චිත්‍රය ව්‍යුහාත්මක වෙනසකට යොමු කළ අයෙකි අයිවන් පීරිස්. මොහුගේ බොහෝ සිතුවම් වන නිශ්චල නිහඬ ශාන්ත භාවයක් පෙන්නුම් කරයි. වර්ණ මාලාව බොහෝදුරට ඒක වර්ණිකය.
* ජස්ටින් දැරණියගලගේ මූලිකම කලාත්මක උපක්‍රමය වන්නේ, වස්තුන්ගේ ස්වභාවය විකෘති කිරීමයි. කැඩපත ළඟ ගැහැණිය චිත්‍රය මධ්‍යගත නිරූපණයක් සහිත සංරචනයකි. අර්ධ ව්‍යුක්තකරණයක් සහිතය.
* රිචඩ් ගේබ්‍රියල්ගේ සිතුවම් වල ගම සහ ගැමි තේමා ජනප්‍රිය ය. ස්වභාවිකත්වය අන්තගාමී ලෙස ශෛලිගත කරන්නට වෑයම් කර නැත.
ඥානවන්ත හා ඥාණවන්ත නොවන කන්‍යාවෝ චිත්‍රයේ රූපක නිරූපණාත්මක හා වර්ණ සංකේතාත්මක ලෙස භාවිතා කර ඇත. කළු පැහැති බාහිර රේඛාවකින් රූප වල සීමා දක්වා ඇත.
* ඩබ්ලිව්.ජේ.ජී. බීලිංගේ කලාත්මක භාෂාව, ඝනිකවාදී කලාවේ ප්‍රයෝග වලින් සමන්විතය. අයිස්ක්‍රීම් කරත්තය චිත්‍රය නිශ්චල, ඝන, රූපක ශාස්ත්‍රාලයීය චිත්‍ර ආකෘතියක් මත ගොඩනගා ඇති චිත්‍රයකි. ද්‍රව්‍ය සම්පිණ්ඩනයේදී ඝනිකවාදී කලා ලක්ෂණ භාවිතාකර ඇත.

03. (i) පිහිටි ගල් ඇතුළට හාරා සහ නෙලන ලද දේවාල. ව්‍යුහාත්මක දේවාල

(ii)* පංච පාණ්ඩව රථ යනු තනි කළුගලින් නෙළන ලද දේවාල විශේෂයකි. මෙම රථ පිළිවෙලින් දෞපදී, අර්ජුන, භීම, ධර්මරාජ සහ නකුල සහදේව රථ යනුවෙන් හඳුන්වයි. නකුල සහදේව රථ හැර අන් සියල්ල තනි ගල්කුලකින් නිමකර ඇත.
* මෙම දේවාල ක්‍රි.ව. 7 වැනි සියවසට අයත් යැයි විශ්වාස කෙරේ.
* මේවායේ පල්ලව වාස්තු විද්‍යාවේ මුල් කාලීන වාස්තුවිද්‍යා ලක්ෂණ පිළිබිඹු වේ.
* මෙම දේවාල සමූහය දකුණු ඉන්දියාවේ මාමල්ලපුරම් හි පිහිටා ඇත.
* දෞපදී රථ පැරණි අතු සෙවිලි කිරීම සහිත වහලයකින් යුත් සරල හා කුඩාම දේවාලයි.
* චතුරස්‍රාකාර කුටියක්මත පිරමීඩාකාර වහලයක් හා අටපට්ටම් ශිඛරයකින් යුතුව අර්ජුන රථ නෙළා ඇත.
* භීම රථ ඍජුකෝණාශ්‍රාකාර හැඩය සහිතව මහල් දෙකකින් යුක්තව නෙළා ඇත. මෙහි වහලයේ බොකුටු ය.
* ධර්මරාජ රථය අර්ජුන රථයේ ආකෘතියට සමාන ය. සැරසිලි අංග බහුලව යොදා ඇත.
* නකුල සහදේව රථය සෙසු රථවලින් වෙන්ව හුදකලාව නෙළා ඇත. එය අනෙක් රථ වලට වඩා වෙනස්ව වෘත්තාකාර හැඩයකින් යුක්තය.

(iii) පල්ලව කලා සම්ප්‍රදායේ කැටයම් මුළුමනින්ම නෙළා ඇත්තේ ගල්වල ය. තමිල්නාඩු ප්‍රාන්තයේ මාමල්ලපුරම් හි පිහිටා ඇති විශාල උන්නත ගල් කැටයමක් ලෙස ආකාශ ගංගාවරෝහණ කැටයම හැඳින්විය හැක. මෙය අතිවිශාල යෝධ කැටයමක් ලෙස විශේෂ තැනක් හිමි කර ගත්තකි. පූජනීය ගංගාව වූ ගංගා නම් ගඟේ උපත පිළිබඳව හින්දු බැතිමතුන්ගේ විශ්වාස මත පදනම් වූ කතාපුවතකි. අර්ජුනගේ ශාපය ලෙස ද මෙය හැඳින්වේ. ආකාශ ගංගාව පොළොව මතට කඩා හැලෙන අයුරු මෙම කැටයමෙන් දැක්වේ. පිහිටි ගලේ මූලික හැඩය ඒ අයුරින්ම උපයෝගී කරගනිමින් දෙවියන්, මිනිසුන් හා සතුන් විශාල ප්‍රමාණයක් සහිතව නෙළා ඇත. මෙය භාරතයේ හමුවන විශාලතම කැටයම ලෙස සැලකේ.
ගංගා නම් ගඟ නිර්මාණය කිරීමේ අසිරිමත් පුවත තේමා කරගෙන හින්දු බැතිමතුන්ගේ විශ්වාසය මත පදනම්ව මෙම කැටයම නෙළා ඇත.
පිහිටි ගලේ වක්‍රාකාරව ඇතුළට නෙරාගිය ස්ථානයකින් ගංගාව ගලා හැලෙන අයුරු දක්වා ඇත. ගලා හැලෙන ජල කඳන් සමඟ ඉහලට පිහිනා යන නා රජෙක් හා නාග කුමරියක් කැටයම් කර ඇත. නාග සිරුරු වලට මිනිස් හිසක් ආරෝපණය කර අලංකාරව පෙන ගොබය දක්වා ඇත. නාග ශරීරයක නම්‍යශීලී ඉරියව් සජීවී ලෙස නෙළීමට ශිල්පියා සමත්ව ඇත.
මේ අසිරිමත් වූ සංකල්පිත සිදුවීම් දෙස විමතියෙන් බලා සිටින මිනිස් රූ, සත්ත්ව රූ හා දේව රූප රාශියකි.

පිහිටි ගලේ ස්වරූපය අනුව උචිත පරිදි අවකාශය ගළපා ගනිමින් යොදා ඇති කැටයම් රාශිය සජීවී බව දනවන අයුරින් නෙලා ඇත. මානව රූප හා දේවරූපවල දේහ ලක්ෂණ කායික සුන්දරත්වය නෙලීමේදී ශිල්පියා දක්වා ඇති කුසලතාවය අතිමහත්ය. විශාල ගල් කුලක මෙතරම් කැටයම් ප්‍රමාණයක් නෙලුවත් එක් කැටයමක හෝ සංගමයෙන් තොරව නෙලූ බවක් දක්නට නැත. විශාල ප්‍රමාණයේ ඇත් රූප හා කුඩා ප්‍රමාණයේ සතුන්ගේ පවා සජීවී බව මතු කිරීමට ශිල්පියා සමත්ව ඇත. විවිධ ඉරියව් සහිත මානව රූපවල සජීවී බවක් ඉස්මතු වන සේ නෙළා ඇත.

මෙහි ඇති රූ රිද්මයානුකූල ලාලිත්‍යයෙන් යුක්තය. සත්ව ඉරියව් සරල වුවත් විශාල ඇත් රූප විශේෂත්වයක් ගන්නා අතර, ප්‍රමාණයෙන් විශාල නිසා කැපී පෙනේ. ඇත් රූප විශාලය නෙළීමත් කැටයම පුරා ඇති අනෙක් රූප කුඩාවට නෙළීමත් මෙහි ඇති විශේෂත්වයකි. මෙම කැටයමෙන් දැක්වෙන කථා පුවත මහා භාරතයේ සඳහන් වන්නකි. එනම් භාග්‍ය රථ නම් අධිබලැති තවුසෙක් විසින් තම ආත්ම බල මහිමෙන් ශිව දෙවියන් කැමති කරවාගෙන අහසින් මිහි මතට ආකාශ ගංගාව පතිත කරවූ කතා පුවත මෙහි තේමාවයි.

04. (i) ශිව වස බීම, රාධාගේ වියරුව, භාරත මාතා, අශෝක දේවිය සහ බෝධිය.

(ii) භාරතය යුරෝපීය ආධිපත්‍යයට පත් වීම නිසා එරටට පැමිණි යුරෝපීය සම්භාව්‍ය චිත්‍ර කලාව හිස ඔසවමින් සිටි සමයක කල්කටා කලායතනයේ ඊ.බී. හැවල් මහතාගේ මගපෙන්වීම මත දේශීය නිර්මාණ අගයන්නට පෙළඹුණු අයෙකි අබනීන්ද්‍රානාත් තාගෝර්.
අජන්තා, එල්ලෝරා, භාග් වැනි කලා නිර්මාණ වලින් පෝෂිත රටකට බටහිර කලාවේ ආගන්තුක බවෙහි නොගැලපීම හොඳින් වටහා ගත් හැවල් මහතා භාරත ශිල්පීන්ට ඒ බව අවබෝධ කරදීමට වෙහෙස වූ අයෙකි. එතුමාගේ මග පෙන්වීම යටතේ දේශීය නිර්මාණ සම්ප්‍රදායන් පිළිබඳ අධ්‍යාපනයක යෙදුන තාගෝර්ට අජන්තා හා මෝගල් චිත්‍ර වල රේඛාව හා වර්ණ හැසිර වූ ආකාරය ගැන අවබෝධ විය.
තෙල් සායම් හා දියසායම් මාධ්‍යයන් හැසිරවීම පිළිබඳ මනා දක්ෂතාවයක් තාගෝර් සතුවිය. ඔහුගේ දියසායම් චිත්‍ර අගනා නිමාවකින් හා නවතාවයකින් යුක්තවිය. කලාත්මක අගයෙන් අනූන භාව ප්‍රකාශනයන්ය. ප්‍රකාශනයේ ගොඩනැගූ හැඩතල වටා ඉතා සංයමයෙන් යුතුව ප්‍රාණ පූර්ණ සියුම් රේඛාවක් යෙදීම මොහුගේ චිත්‍ර ශෛලියේ කැපී පෙනෙන ලක්ෂණය.
මෝගල් රාජ්පුට් ශෛලියන් හදාරමින් ලත් අත්දැකීම් අනුව චිත්‍ර වටා රාමුවක් යෙදීම භාරත මාතා චිත්‍රයෙහි දක්නට ඇත. ඇසට ප්‍රිය වර්ණ මාලාවක් හා පෙරදිග චිත්‍ර කල්වන්හි විශේෂයෙන්ම අජන්තාවේ දක්නට ඇති රේඛාවේ ලාලිත්‍යය ද ඔහු සතුය. ඔහුගේ චිත්‍ර වල මතුපිටින් පෙනෙන රුවට වඩා අභ්‍යන්තර කතාවක් ඇති බවක් දක්නට ලැබේ. භාරත මාතා සහ අශෝක දේවිය සහ බෝධිය චිත්‍රවල පහත කොටසේ අඳුරු බවකුත්, ඉහළ කොටසේ පහළ සිට පැතිර යන ආලෝකයකුත් දක්නට ඇත. අශෝක දේවියගේ මුහුණ ආලෝකමත් වන සේ වර්ණ යොදා ඇත.
භාරතයේ නූතන චිත්‍ර කලාවේ පුරෝගාමියෙකු වූ අබනින්ද්‍රනාත් පසුකාලීන දක්ෂ සිත්තර පරම්පරාවක් බිහි කළ භාරතීය චිත්‍ර කලාවේ උන්නතියට මහඟු සේවයක් කළ ශිල්පියෙකි.

(iii) නූතන චිත්‍ර කලා සම්ප්‍රදායන් ගැන ගවේෂණාත්මක පර්යේෂණයක යෙදෙමින් නව නිර්මාණ රැසක් බිහි කළ අයෙක් ලෙස ජෙමිනි ජෝයි හැඳින්විය හැකිය. 16 වන සියවසේදී කල්කටාවේ රජයේ කලායතනයට බැඳුනේ කුඩා කල සිටම තිබූ චිත්‍ර කලා හැකියාව වැඩිදියුණු කරගැනීමටය. එහිදී යුරෝපීය ශාස්ත්‍රාලීය කලාවේ මූලධර්ම ද අධ්‍යයනය කිරීමට සිදුවිය. යුරෝපයේ පර්යාවලෝක චිත්‍ර ශෛලිය අධ්‍යයනය කරමින් තෙල් සායම් හා දියසායම් මාධ්‍ය ප්‍රගුණ කරන ලදී. පසුව තමාටම ආවේණික දේශීය ශෛලියක් ගොඩනගා ගැනීමට සමත්විය. තම මව් රටේ අභිමානවත් කලා සම්ප්‍රදායන් පිළිබඳ පර්යේෂණය කර තමාටම ආවේණික ශෛලියක් ගොඩනගා ගන්නා ලදී.
* ජෙමිනි රෝයි රේඛා හැඩතල තුළින් අපූර්ව සෞන්දර්යයක් දකිමින් වර්ණ තුළින් එයට විචිත්‍රත්වයක් එක්කර ඇත.
* මුලදී චිත්‍ර ද්විමාන බවක් සහිතය.
* රේඛාකරණයෙන් පසු හැඩතල පිරී යන සේ වර්ණ එක්කර හැඩතල වටාඟන බාහිර රේඛාවක් යෙදීය.
* අලංකාර සැරසිලි යොදා හැඩතල විසිතුරු කර ඇත.
* පසුව ලාලිත්‍යමය ස්වභාවය වෙනස් කර සරල ජ්‍යාමිතික බවක් එක්කර ඇත.
* පැතලි හැඩතල තුළ ඇත්තේ පැහැපත් වර්ණ ආලේපයකි.
* පසුබිමෙහි හිස්බව මකාදැමීමට තිරස් හා සිරස් හැඩතල යොදා අලංකාර කර ඇත.
* ස්වභාවික පරිමාණයෙන් ඉවත්ව නිර්මාණාත්මක බවක් එක්කරයි.
* ඔහුගේ භාවාත්මක සරල ශෛලිය තුල බයිසන්තියානු කලා ලක්ෂණ ඇති බව විචාරක මතයයි.
* ඔහුගේ සියලු නිර්මාණ වල දෙඇස් හි අඩවන් බවක් දක්නට ඇත.
* තාත්වික බව හා ස්වභාවික බව අතර සැරිසරමින් කළ සිතුවම ක්‍රිස්තු පුවතයි. එය සරළ ඍජු හැඩතල වලින් යුක්තය.
* නාසය දිගටිය, දෙතොල් කුඩාය, දිගටි මුහුණේ උඩුරැවුල ගාම්භීර බවක් එක්කර ඇත.
* මව සහ දරුවා සිතුවම චලන ඉරියව්වකින් යුක්තය.
* සැරසිලි සහිත මවගේ හා දරුවාගේ සෙනෙහස පෙන්වීමට ශිල්පියා සමත්ව ඇත. එය භාවමය ඉරියව් හා දෙඇස්හි බැල්මෙන් පෙන්වා ඇත.
* මවගේ ඉරියව්ව තිවංග හැඩයෙන් යුක්තය.

* තලය මුළුමනින්ම භාවිත 'කාන්තාවන් තිදෙනා' චිත්‍රය ප්‍රශස්ත කලා නිර්මාණයකි. සැබෑ ඉන්දීය කතුන් ගේ ස්වරූපය ඇඳුම් පැළඳුම්වල ස්වභාවයෙන් දැකියහැක.
* 'බළලා සහ පොකිරිස්සා' 'බළල්ලු දෙදෙනා සහ ඉස්සෝ' නූතන චිත්‍ර කලා ප්‍රවේශයේ ලක්ෂණ පෙන්වයි.
* සනිකවාදී ලක්ෂණ සහිතයි. හැඩතල නිර්මාණශීලීය.
* 'බළලා සහ පොකිරිස්සා' නම් වූ චිත්‍රයේ දෙනෙතින් පවා බළලාගේ සැහැසි බව පෙන්වා ඇත. චිත්‍රයක් සඳහා යොදාගත් දුර්ලභ මාතෘකාවකි.
භාරතයේ ප්‍රධාන පෙළේ ශිල්පීන් අතර අම්රිතා ශෝර්ගිල් දක්ෂ චිත්‍ර ශිල්පිනියකි. වර්ණ හා හැඩතල භාවිතය අතින් පිරිමින්ට නොදෙවෙනි දක්ෂතා පෙන්වා ඇත. ප්‍රංශයේ දී චිත්‍ර කලාව පිළිබඳ ශාස්ත්‍රාලයීය අධ්‍යාපනයක් ලබා ඇත.
* බෞද්ධ හින්දු කලා නිර්මාණ අධ්‍යයනය කර තමාටම ආවේණික ශෛලියක් ගොඩනගාගෙන ඇත.
* ඉන්දීය ජීවිතයේ දුක් දොම්නස්, ජීවත්වීමට දරන වෑයම ඇයගේ තෙලිතුඩින් ඔපවත් විය.
* ඇයගේ ශෛලිය ඇයටම ආවේණික වූ ශෛලියකි.
* ඉන්දීය ලක්ෂණ, චර්යා රටා, ඇඳුම් පැළඳුම් අර්ථවත්ව අවස්ථාවට උචිත ලෙස යොදා ගෙන ඇත.
* වර්ණ භාවිතය අර්ථාන්විතය.
* ඉන්දීය ජනයාගේ දුක් පීඩා, ජීවන ගැටලු හඳුනාගත් ඇය ඔවුන්ගේ අහිංසක බව මැනැවින් පෙන්වා ඇත.
* 'බ්‍රහ්මචාරී' නම් වූ චිත්‍රයේ පූජකවරුන්ගේ අධ්‍යාත්මික ගුණ දැක්වීමට උත්සාහ දරා ඇත. එකිනෙක රූ අතර පවතින අන්තර් සබඳතාව සම්පිණ්ඩනයේ උසස් බව විදහා දක්වයි.
* චිත්‍ර වලට යොදා ඇති මාතෘකා අනුව මුහුණුවල හැඟීම්බර බව විශිෂ්ට ලෙස පිළිබිඹු කර ඇත.
* වර්ණ මිශ්‍ර සකස් කරගත් සෞම්‍ය වර්ණ භාවිතය චිත්‍ර වල සුන්දරත්වය ඉස්මතු කර ඇති බවට හොඳ උදාහරණයකි. 'ගැහැනුන් දෙදෙනා' චිත්‍රය.
* 'කඳුකර යුවතියෝ' හා 'කඳුකර මිනිසුන්' චිත්‍රවල කඳුකර දේශගුණික පරිසරයට අනුව අඳින ඇඳුම් පවා පෙන්වා ඇත.
* චිත්‍ර වල මුහුණුවර ඇති ගැඹුරු කල්පනාකාරී බව තුළින් ගැමි ජීවිතයේ කටුක දිවි පෙවෙතක් ගෙවන මිනිසුන්ගේ චිත්ත ස්වභාවය මනාව පිළිබිඹු කරයි.
* චිත්‍රවල මානව රූ සංරචනයේ අන්තර්පුද්ගල සබඳතාව, හැඩතල රචනයේ අපිරිමිත දක්ෂතාව පෙන්වයි.
ඉන්දීය ජන ජීවිතයේ සංස්කෘතික ලක්ෂණ තම තෙලිතුඩින් ඔපවත් කිරීමට සමත්වූ අම්රිතා තමාටම ආවේණික ශෛලියක් ගොඩනගා ගත් ශිල්පිනියකි.

05. (i) ටයිටස් ආරුක්කුව, කොන්ස්ටන්ටයින් ආරුක්කුව, සෙප්ටිමස් ආරුක්කුව, ට්‍රජන් ආරුක්කුව.

(ii) රෝමන්වරු තම යුධ ජයග්‍රහණ සිහිවීම පිණිස විජයග්‍රහණ ආරුක්කු ඉදි කළා සේම විජයග්‍රහණ කුළුණු ඉදිකළ අවස්ථාද හමුවේ. විජයග්‍රහණ කුළුණු යුද්ධ ජයග්‍රහණ සඳහා ඉදිකරන ලද වාස්තු විද්‍යාත්මක නිර්මාණ අංගයකි. මේ අතරින් ට්‍රජන් කුළුණ ඉතා වැදගත් නිර්මාණයකි.
* කුළුණු බඳ අඩි 98 ක් පමණ උස් වන අතර පාදමය පාදමද සමඟ උස අඩි 125ක් පමණය. මෙහි වක්‍ර පෘෂ්ඨය හරහා සර්පිලාකාරව ඉහළ නගින රේඛාවක් මගින් දිගු තීරුවකට බෙදා ඇත. මෙම තීරුවේ ඔවුන්ගේ විජයග්‍රහණ තොරතුරු කැටයම් කර ඇත. මෙහි දැක්වෙන්නේ රෝම හමුදාව ඩේසියානු හමුදාවට එරෙහිව කළ සටන පිළිබඳ කැටයම්ය. මෙහි දර්ශන 154 කි.
* මාකස් ඕරුලියස් කුලුන ද මෙම ආකෘතිය අනුව ඉදිවී ඇති අතර, ඒ මත අධිරාජයාගේ පිළිරුවක් නංවා ඇත. මෙම කුළුණු වල ඉතා ළඟ ළඟ යොදන ලද කැටයම් බහුලය.

(iii) ක්‍රි.ව. 1 - 5 දක්වා රෝම කලා කෘති රැසක් නිමවා ඇත. රෝම ශිල්පීන් මනුෂ්‍යත්වයට දේවත්වය ආරූඪ නොකර මිනිස් බව ආරූඪ කිරීමට උත්සාහ කළහ. ස්වභාවික පරිමාණ හා ස්වභාවික ලක්ෂණ වලින් යුක්ත මූර්ති නිර්මාණය කිරීම රෝම ශිල්පීන්ගේ අවශ්‍යතාවය විය. රෝමවරුන් නිමවූ ශීර්ෂ මූර්ති අතර ජූලියස් සීසර් , ප්‍රොම්පෙ, කැරකාලා, පිසාරෝ, මාකස් ඔරුලියස්, ඔගස්ටස් වැනි අධිරාජ්‍යයන්ගේ රූ ඇත.
* ජූලියස් සීසර් මූර්තියෙහි ශිල්පියාගේ නිර්මාණශීලී හැකියාව මැනවින් පිළිබිඹු වේ. අධිරාජයාගේ චරිත ලක්ෂණ හා වයස් සීමාව පවා දැක්වීමට ශිල්පියා සමත්වී ඇත. මුහුණේ මාංශ පේශීවල පිරිපුන් බව අඩු නිසා මැදිවයසේ අයෙකුගේ ලක්ෂණ පෙන්නුම් කෙරේ.
රෝම මූර්ති කලාවේ තාත්විකවාදී නැඹුරුව සහිතව මුහුණේ මාංශමය සැකසුම නහර මස්පිඬුවල මෙන්ම සමේ ස්වභාවය ද පෙන්වීමට ශිල්පියා සමත්ව ඇත.
* කිරිගරුඬ මාධ්‍යයෙන් නෙලීමේදී මාධ්‍ය ස්වභාවය, මූර්තිය සැකසීමේදී හසුරුවා ගෙන ඇති ආකාරය රෝම මෙන්ම ග්‍රීක මූර්ති ශිල්පීන් ද මැනවින් අවබෝධ කරගෙන ඇත. ග්‍රීක මූර්තිවල වැඩිවශයෙන් දක්නට ඇති මුහුණුවල සෞම්‍ය බවට වඩා රෝම මුර්ති වල තාත්විකවාදී නැඹුරුව අගය කළ යුතුය.
* කැරකැල්ලා විද්ධ මූර්තිය කිරිගරුඬින් නෙළා ඇත. ඇඩ් බැල්මකින්දැඩි බැල්මකින් බලා හිඳින ඉරියව්වක් මූර්තිමත්කර ඇත.
රෝම මූර්ති අතර දක්නට ඇති පෞද්ගලික චරිත ලක්ෂණ මැනවින් පිළිබිඹු කර ඇති මූර්තියකි.
* හැඟීම් ප්‍රකාශනය අතින් ප්‍රබල නිර්මාණයකි. යමක් දෙස සැක සහිතව බලන අයුරු පෙන්වා ඇත. තීක්ෂණ බැල්ම හා කල්පනාකාරී බව මුහුණේ ඉරියව් තුළින් පෙන්වා ඇත. ඇහිබැම හකුළා ඇස යටින් හෙළන බැල්ම ස්වභාවිකව මූර්තිමත් කර තිබේ.
* ඇහි බැම අතර රැළි ස්වභාවය, තදින් පියවුණු දෙතොල, කැරලි ගැසුණු හිසකෙස් මනාව පිළිබිඹු කර ඇත. කුරිරු පාලකයින්ගේ ස්වභාවය හා ආවේගශීලී පුද්ගලයකුගේ ස්වභාවයත්, ඔලොගුවක් වැනි ඇඳුම මඟින් වංශාධිපතියෙකු ගේ ලක්ෂණ ඉස්මතු වන පරිදි මූර්තිය නෙළා තිබීම ශිල්පීය දක්ෂතාවය ඉතා හොඳින් නිරූපණය කරන අවස්ථාවකි.

* දැනට වතිකානු කෞතුකාගාරයේ ඇති ඔගස්ටස් සීසර් අධිරාජයාගේ හිටි පිළිමය ප්‍රතාපවත් ලීලාව සහිත හිටි පිළිමයකි.
* යුද්ධ සන්නාහ ඇඳුමක් සහිතව දකුණත ඔසවා දඹර ඇඟිල්ල දිගුකර විධානයක් දෙන ස්වරූපයෙන් නෙළා ඇත.
* පය පාමුල කුඩා සුර දූතයෙකු යොදා ඇත්තේ අධිරාජයාට දේවත්වය ආරූඪ කිරීමේ අරමුණින් යයි සැලකේ.
* රෝම අධිරාජ්‍යවරයෙකුගේ තෙද බලමහිමය පෙන්වමින් අලංකාර කැටයම් සහිත උඩුකය ඇඳුමකින් ගත සරසමින්, භාව ප්‍රකාශනය ඉහළ මට්ටමකට ගෙන ඒමට ද ශිල්පියා සමත්වී ඇත.
කිරිගරුඬ මාධ්‍ය මූර්තියට උචිත පරිදි යොදා ගනිමින්, අධිරාජයෙකුගේ තේජවන්ත බව පෙන්වමින් උසස් මූර්තිමය ලක්ෂණ විදහා දැක්වීම නිසා මෙම මූර්තියෙන් ද ශිල්පියාගේ ප්‍රතිභාව මනා ලෙස පෙන්වා තිබේ.

06. (i) අර්තාපල් බුදින්නෝ, තරු පිරි රය, පුටුව, හිරගෙදර ආලින්දය, තිරිඟු යාය මතින් ඉගිලෙන කපුටෝ, ආර්ලස්හි පාලම, රාත්‍රී අවන්හල.

(ii)ඕලන්ද ප්‍රභවයකින් සහිත ප්‍රශ්චාත් උපස්තිතිවාදි සිත්තරෙකි.
* ස්ව - ආලේඛ්‍ය , ආලේඛ්‍ය, භූ දර්ශන, නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩන, කෙත්වතු, සයිප්‍රස් ගස් ආදිය ඔහුගේ තේමා අතර ප්‍රමුඛ වේ.
* චිත්‍ර කලාව පිළිබඳ කිසිම ශාස්ත්‍රීය අධ්‍යාපනයක් නොලබා මූලික සිද්ධාන්ත හා ශිල්පීය ක්‍රම අධ්‍යයනය කළේ තමාගේම උත්සාහයෙනි.
* දුප්පත් පිටිසර ගොවීන්, රෙදි වියන්නන් ආදී කර්මාන්තවල නියැලුනු අය, පීඩිත පන්තියේ ජනයා ඇසුරු කළ ඔහු ඔවුන්ගේ ජීවිත වල තිබූ දරිද්‍රතාවය අඳුරු සහිත බව සිතීයමට නැගීය.
* 'අර්තාපල් බුදින්නෝ' චිත්‍රයේ දිළිඳු ජනයාගේ දුක් දොම්නස් ද 'හිරගෙදර ආලින්දය' චිත්‍රයෙන් හිර ගෙදර බිත්ති අතර ඇති අඳුරු බව, ජීවිතවල ඇති අපේක්ෂාභංගත්වය, තැවුල් සහගත බව පෙන්වීමට සමත් ව ඇත.
* අඳුරු වර්ණ වලින් මිදී දීප්තිමත් වර්ණ භාවිතයට හැරුණු බවද පෙනෙන්නට තිබේ. 'තරු පිරි රය' ඊට නිදසුනකි. තරු පිරි රයක චමත්කාරය ද හුදෙකලා ශෝකාත්මක බවක්ද පෙන්නුම් කෙරේ.
* කැන්වසය මත සායම් මිශ්‍රකිරීම ද ඔහුගේ විශේෂත්වයකි.
* 'රාත්‍රී අවන්හල' චිත්‍රයෙන් හිස් වූ අවන්හලේ පාළු බව, ශෝකාන්තය දක්වා ඇත. ඒ ඔහුගේ දැක්මයි.
* චිත්‍රමය දෘශ්‍ය මාධ්‍ය තුළින් මනුෂ්‍යත්වය දෙස සානුකම්පිතව බැලූ එකම ශිල්පියා වින්සන්ට් වැන්ගෝ ය.
* තම චරිත ලක්ෂණ හා සිතිවිලි රටාව සංක්ෂිප්ත වර්ණරටා තුළින් දැක්වීමට උත්සාහ දරා ඇත.
* විචිත්‍ර වර්ණ මාලාව, ආවේගාත්මක රළු ප්‍රබල බුරුසු පහරවල් ඔහුගේ සිතුවම් වල දක්නට ඇත

(iii)* පශ්චාත් උපස්තිතිවාදි සිත්තරෙකි.
* 20 වන සියවසේ නූතනවාදී ප්‍රවණතා රැසකට පදනම සැපයූ සිත්තරෙකි.
* ස්වභාවික ලෝකය ඒ අයුරින්ම පිටපත් කිරීම බැහැර කර, එය විවිධ ආවේශයන් ට අනුව විකෘති කිරීම් වෙනස් කිරීම් අතිශයෝක්තියට නැගීම් සහ ජාමිතික රූපී ව්‍යුහයන් අවධාරණය කිරීම් සහිතව ඇඳ තිබේ.
* එකිනෙකාට මුහුණලා කාඩ් සෙල්ලම් කරන පිරිමින් දෙදෙනෙකු සහිත පෝල් සෙසාන් විසින් අඳින ලද සිතුවම 'කාඩ් සෙල්ලම් කරන්නෝ' නමින් නම්කර ඇත. කරන ක්‍රීඩාවට මහත් අවධානයකින් සිටින අයුරින් සිතුවම ඇඳ ඇත.
* චිත්‍රයේ පසුබිම පැතලි ස්වරූපය අවධාරණය වන වර්ණ පසාද සමූහයක් බවට පත්කර ඇත. සෙසාන් විසින් භාවිත කළ ප්‍රකට උපක්‍රමයක් වූ පින්සල් අවධාරණය වන පරිදි කළ වර්ණාලේප මෙම සිතුවමේ ද ඇත.
* චිත්‍රයේ පසුබිම අඳුරු ස්වභාවයෙන් යුක්ත බැවින් මානව රූපවල ආලෝකමත් බව කැපී පෙනේ. උණුසුම් හා අඳුරු වර්ණ ගැටෙන පරිදි ආසන්නව යොදා තිබීමෙන් සිතුවමට අපූර්වත්වයක් එක් කර තිබේ.
* කඳු බෑවුමක පිහිටි හුදකලා පාලු නිවසක් සහිත 'ඉරි තැළුනු බිත්ති සහිත නිවස' චිත්‍රය ප්‍රවේශමෙන් හා නිශ්චිත අරමුණක් සහිතව තැබූ කෙටි බුරුසු පහරවල් සමූහයකින් සිත්තම ගොඩනැගී ඇත. සිතියමේ පහළ කොටසෙහි පින්සල් පහරවල වේගවත් බවත් දැකිය හැක. චිත්‍රයෙහි සමස්තය පැහැදිලි බවක් දැක්වෙනසේ වර්ණ මාලාව භාවිතාකර ඇත. ශීත හා උෂ්ණ වර්ණ එකිනෙක හා ගැටෙන පරිදි යෙදීම මෙම චිත්‍රයේ ද දැකිය හැකිය.
* නිවස පැති පෙනුමෙන් යුක්තය. නිවසේ පහළ කොටසට වඩා ඉහළ කොටසේ බිත්තියෙහි පැල්ම විශාලව දක්වා තිබීමෙන් නිවසේ ඇති පැරණි බව, ගරා වැටුණු බව වඩාත් තීව්‍ර වී පෙනේ.
* සෙසාන්ට අවශ්‍ය වූ චංචලත්වය වෙනුවට නිශ්චලත්වයේ ගැඹුර ප්‍රකාශ කිරීම මෙම සිතුවමෙන් මනාව චිත්‍රණය කර ඇත.* වහලයේ රත් පැහැ දාර චිත්‍රයේ ඇස ඇදගන්නා ප්‍රබල සීමාවක් වේ.* රූප වල ආකෘතිය හා වර්ණය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වා ඇත.* සෙසාන් ගේ සිතුවම්වලින් ඝනිකවාදීන්ට මග පෙන්වීමක් ද දක්වා ඇතැයි මතයක් පවතී.

**දෙවන වාර පරීක්ෂණය - 2019 - 13 ශ්‍රේණිය**

**චිත්‍ර කලාව II - ආදර්ශ චිත්‍රය පිළිතුරු පත්‍රය**

---

ඉරි සහිත රෙදි කැබැල්ලක්
20cm x 10cm ප්‍රමාණයේ සුදු කඩදාසියකින් ආවරණය කළ පෙට්ටියක්
කොළ පහක් සහිත ක්‍රෝටන් අත්තක්
ලීටරය ප්‍රමාණයේ සුදු ප්ලාස්ටික් බෝතලයක්
කොමඩු ගෙඩියක් (1/3 ප්‍රමාණයක් ඉවත් කර)
වීදුරුවක් (අඩක් කහ වර්ණය යෙදූ ජලය පුරවා) බීම බටයක් , ද්‍රව්‍ය තැබීමට ආධාරකයක්

## දෙවන වාර පරීක්ෂණය - 2019 - 13 ශ්‍රේණිය

## චිත්‍ර කලාව II - ලකුණු දීමේ නිර්ණායක
## නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය

අභිමාතාර්ථ

1. ස්වභාවික හා නිර්මිත වස්තූන්ගේ ස්වභාවය හා හැඩය තේරුම් ගැනීමේ හැකියාව හා සිද්ධාන්ත භාවිතය පිළිබඳ කුසලතාව හා ක්‍රම ශිල්ප භාවිතය මැන බැලිම.
2. රේඛා මාධ්‍ය භාවිතයෙන් වස්තූන් ගේ ගති ලක්ෂණ නිරූපණය වනසේ ප්‍රකාශ කිරීමේ හැකියාව හා සම්පිණ්ඩනය කිරීමේ හැකියාව මැන බැලීම.
3. වර්ණ භාවිතා කිරීමේ ක්‍රම ශිල්ප හා වස්තූන්ගේ ගති ලක්ෂණ මතුවන සේ වර්ණා භාවිතාය පිළිබඳ හැකියාව මැන බැලීම

II වන පත්‍රය සඳහා අපේක්ෂකයන් ඇඳ ඇත්තේ එක් වර්ණ චිත්‍රයක් පමණි. මෙයන් ද්‍රව්‍ය සමූහය ඇසුරින් යථාරූපී චිත්‍රයක් ඇඳ වර්ණ කර නිම කිරීම අපේක්ෂා කෙරේ. මේ සඳහා ලකුණු තීරණය කල යුතුවේ. එකිනෙක නිර්ණායකන් යටතේ තීරණයකට එළඹ ලකුණු තීරණය කළ මැනවි. මෙහිදී තම රුචිය අනුව චිත්‍රය ඇගයීමට භාජනය නොකළ යුතු අතර අපේක්ෂකයා ප්‍රදර්ශනය කර ඇති කුසලතා තේරුම් ගෙන එය පදනම් කරගෙන ඇගයීමෙ කල යුතුවේ.

ලකුණු දීමේ නිර්ණායක :-

| | |
|---|---|
| 01. ද්‍රව්‍ය සමූහය තලය මත අර්ථවත් ව සංරචනය කිරීමේ හැකියාව | (ල. 20) |
| 02. ද්‍රව්‍යයක්ගේ පරිමාණ හා ස්වභාවය ප්‍රකාශ කිරීමේ හැකියාව | (ල. 20) |
| 03. සිද්ධාන්ත භාවිතය පිළිබඳ අවබෝධය (පර්යාන්තලෝකය,ත්‍රිමාණ ලක්‍ෂණ, ඇස්මට්ටම, අවකාශ භාවිතය) | (ල. 20) |
| 04. වර්ණ භාවිතය හා ගති ලක්‍ෂණ දැක්වීම. | (ල. 20) |
| 05. චිත්‍රයේ පසුතලය ඇතුළු සමස්ථ නිමාව | (ල. 20) |

II වන ප්‍රශ්න පත්‍රය සඳහා හිමිවන මුළු ලකුණු 100

---

## දෙවන වාර පරීක්ෂණය - 2019 - 13 ශ්‍රේණිය
## චිත්‍ර කලාව III - ලකුණු දීමේ නිර්ණායක
## "අ" කොටස - චිත්‍ර සංරචනය

ලකුණු දීමේ පටිපාටිය:-

### III - පත්‍රය 'අ' චිත්‍ර සම්පිණ්ඩනය

1. තොරාගත් මාතෘකාව ප්‍රකාශ කිරීමේ දී ඊට උචිත වාතාවරණය හා පරිසරය ප්‍රකාශ කර ඇති අයුරුව (ලකුණු 20)
2. රේඛා හැඩතල ඇසුරින් මානව රූ ඇතුළු සියලු හැඩතල තලය මත සම්පිණ්ඩනය කර ඇති අයුරුව(ලකුණු 20)
3. සිද්ධාන්ත භාවිතය පිළිබඳ අවබෝධය (පරිමාණ, පර්යාලෝකය, ත්‍රිමාණ ලක්ෂණ, ඇස්මට්ටම හා අවකාශ භාවිතය (ලකුණු 20)
4. වර්ණ භාවිතයේ දක්වා ඇති කුසලතාව (ලකුණු 20)
5. අනුගමනය කර ඇති ශෛලීය හා සමස්ත නිමාව (ලකුණු 20)

(ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු 100)

### III - පත්‍රය 'ආ' මෝස්තර හා සැරසිලි නිර්මාණය

| | |
|---|---|
| 1. මාතෘකාවට අදාල නිර්මාණ කාර්යයට උචිත අයුරින් | (ලකුණු 20) |
| 2. පාරිභාරික අවශ්‍යතාවයන්ට ගැලපෙන බව හා කර්මාන්තයට | (ලකුණු 20) |
| 3. රේඛා හැඩතල අර්ථවත්ව යොදා ගැනීමේ හැකියාව | (ලකුණු 20) |
| 4. උචිත වර්ණ තෝරා ගැනීමේ හා භාවිත කිරීමේ කුසලතාව | (ලකුණු 20) |
| 5. විචිත්‍රත්වය, චමත්කාරය හා නිර්මාණයේ සාර්ථකත්වය | (ලකුණු 20) |

(ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු 100)

### III - පත්‍රය 'ඉ' ග්‍රැෆික් නිර්මාණය

| | |
|---|---|
| 1. මාතෘකාවට අදාළ නිර්මාණ කාර්යයට උචිත අයුරින් නවතාවයකින් යුතුව සැලසුම් කිරීමේ හැකියාව | (ලකුණු 20) |
| 2. වාණිජමය හා සන්නිවේදන අවශ්‍යතාවන්ට ගැලපෙන බව හා කර්මාන්තයට උචිත බව. | (ලකුණු 20) |
| 3. රේඛා හැඩතල අර්ථවත්ව යොදාගැනීමේ හැකියාව | (ලකුණු 20) |
| 4. උචිත වර්ණ තෝරා ගැනීමේ හා භාවිත කිරීමේ කුසලතාව | (ලකුණු 20) |
| 5. විචිත්‍රත්වය, චමත්කාරය හා නිර්මාණයේ සාර්ථකත්වය | (ලකුණු 20) |

(ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු 100)

**දෙවන වාර පරීක්ෂණය 2019 චිත්‍ර කලාව II පත්‍රය - ආදර්ශ චිත්‍ර සටහන**

**இரண்டாந் தவணைப் பரீட்சை – 2019 சித்திரக்கலை – பகுதி II – மாதிரி பத்திரம்**

**13 ශ්‍රේණිය – தரம் 13**

**ශාලාධිපතිට උපදෙස්**

**අවශ්‍ය ද්‍රව්‍ය :-** ඉරි සහිත රෙදි කැබැල්ලක්
20cm x 10cm ප්‍රමාණයේ සුදු කඩදාසියකින් ආවරණය කළ පෙට්ටියක්
කොළ පහක් සහිත ක්‍රෝටන් අත්තක්
ලීටරය ප්‍රමාණයේ සුදු ප්ලාස්ටික් බෝතලයක්
කොමඩු ගෙඩියක් (1/3 ප්‍රමාණයක් ඉවත් කර)
වීදුරුවක් (අඩක් කහ වර්ණය යෙදූ ජලය පුරවා)
බීම බටයක්
ද්‍රව්‍ය තැබීමට ආධාරකයක්

**மேற்பார்வையாளருக்குரியது.**

**தேவைப்படுபவை :**
சிறிய குடம்
வர்ணத் துணி துண்டு
வெள்ளை கடதாசியால் சுற்றப்பட்ட பிஸ்கட் பெட்டி (20cm x 10cm)
ஐந்து இலைகளுடன் கூடிய அலரிக் கிளை பூவுடன்
தண்ணீர் குடிக்கும் கிளாஸ் (அரைவாசி நீர்நிரப்பி)
தேங்காய் பாதி – 1
பென்சில் -1
பொருட்களை வைக்கும் பலகை

